# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2371/13 – 2024 පෙබරවාරි මස 13 වැනි අඟහරුවාදා – 2024.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 19/78 (VII)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**ආචාර්ය විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2024 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2023 නොවැම්බර් මස 27 වැනි දින අංක 2360/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 3 දරන සාමදාන විනිශ්චයකාරවරයන් (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම පද්ධතිය) නියෝග, එකී නියෝග යටතේ දැනටමත් සිදු කර ඇති පත් කිරීම් හෝ ඒ යටතේ සිදු කර ඇති කිසිවකට අගතියක් නොවන පරිදි, එකී නියෝගවල 2 වන නියෝගයේ “(එ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ විෂයන්’’ යන වචනවල සිට “අමාත්‍යවරයා විසින් ලිඛිතව හේතු දක්වමින් ඔහුට, එකී තනතුර පිරිනමනු ලැබිය හැකි ය; සහ ’’ යන වචන දක්වා වන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ:-


1A – PG 6642 – 326 (2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

" (ළ) වාර දෙකකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන සාමාර්ථ දෙකක් සමග විෂයන් හයක් සමත් තැනැත්තකු වීම:

කෙසේ වුව ද, විශේෂ අවස්ථාගත කරුණුවල දී, වාර දෙකකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන සාමාර්ථ දෙකක් සමග විෂයන් හයක් සමත් නොමැති තැනැත්තකු වුව ද, එකී තැනැත්තාගේ ප්‍රාදේශීය ප්‍රජාවේ කීර්ති නාමයක් ඇති ආගමික නායකයකු හෝ යම් සංගමයක, සේවාවක හෝ සමිතියක සභාපතිවරයකු විසින්, එකී තැනැත්තා ප්‍රජාව වෙත සිදු කරන ලද ආදර්ශවත් සේවය සලකා බලා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත් කිරීම සඳහා එකී තැනැත්තාගේ යෝග්‍යතාවය තහවුරු කරමින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය; සහ''.

EOG 02 – 0093

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.